330

RARE

# යුද්ධ අවදානමට ලක්වන ගම්මානයක වැසියන්ගේ ජීවන රටාව හා ඒ ආශ්‍රිත ගැටළු පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්.

එස්.එල් .එම්. එස්.එන්.රණවීර.

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ සමාජ විද්‍යාව පිළිබඳ
සමාජීය විද්‍යාපති උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී .

1999 අගෝස්තු

330

යුද්ධය නිසා ගම්වැසියන් මුහුණ දී ඇති තත්ත්වය ඝට්ටනවාදී න්‍යාය ඔස්සේ ගැනෙන අන්තර්ජන්‍ය ගැටුමක් ලෙස පෙන්වා දිය හැක. රැල්ෆ් ඩහරෙන්ඩොෆ් වැනියවුන්ගේ අදහස් අනුව සමාජය තුළ විවිධ අපේක්ෂාවන් අසමාන ලෙස බෙදියාමෙන් විවිධ ගැටුම් ඇතිවේ. ලාංකික ජනවාර්  ගික අර්  බුදය ඇතිවීමේලා මූලික වූ හේතුවක් ලෙස මෙම තත්ත්වය පැහැදිලිව හඳුනාගත හැක. එසේම විවිධ සමාජවල ප්‍රධාන ආධිපත්‍ය විසින් ලනු ලබන තීරණ එම ආධිපත්‍ය පිළිපදින්නන් අතරත් ගැටුම් ඇතිවන බව ඝට්ටනවාදයේදී පෙන්වා දෙනු ලබයි. මේ අනුව කිසියම් අයුරක ආධිපත්‍ය පිළිබඳ ගැටුමක් ලෙසද මෙම අර්බුදය පෙන්වා දිය හැක.

මෙලෙස විවිධ ගැටුම් සමාජයේ ඇති විම හේතුකර ගෙන සමාජ ඒකාබද්ධතාවය බිඳ වැටීමට හේතු විය. කෘත්‍ය වාදය වැනි සමාජවිද්‍යා න්‍යායන් මගින් පෙන්වා දෙන්නේ සමාජයේ සෘජු පැවැත්මට සෑම සමාජ අංගයක්ම නිසිපරිදි ඉටුවිය යුතු බවයි. විශේෂයෙන්ම ව්‍යුහාත්මක කෘත්‍ය වාදයේදී (structural functionalism) සමාජයේ ඒ ඒ සමාජ සංස්ථාවන් මගින් ඉටුවන කෘත්‍ය වාදයන්හි ඇති වැදගත්කම ඉතා ඉහලින් අගය කර ඇත. හර්බට් ස්පෙන්සර්   වැනි සමාජවිද්‍යාඥයින් පෙන්වා දුන් පරිදි පුද්ගල ශරීරයේ පැවැත්මට සෑම ඉන්ද්‍රියක්ම වැදගත් සේම සමාජයේ පැවැත්මට සෑම සමාජ ඒකකයක්ම වැදගත් වේ .යම් අයුරකින් එක් පුද්ගල ඉන්ද්‍රියක් අඩපන විමෙන් පුද්ගලයා අක්‍රිය වන්නා සේම සමාජයේ එක් සමාජ අංගයක් අඩපණ වීමෙන් සමස්ත සමාජයම අඩපණ විය හැකිය .ලාංකික දේශපාලන ප්‍රවාහය තුළ ඇතිවුණු මෙම අර්බුදය නිසා අධ්‍යාපනික, ආර්ථික, සමාජීය ආදී සෑම ක්ෂේත්‍රයකම අක්‍රියවී ඇති අයුරු කෘත්‍ය වාදී දෘෂ්ටි කෝණයකින් මෙහිදී විමසා බැලිය මෙලෙස ඇතිවන සමාජ අර්බුදය හමුවේ සිදු වන ප්‍රතිඵලය වන්නේ මිනිසුන් තුළ ඇතිවන සාමූහික විංඥානය (collective conciousness) බිඳ වැටී සමාජ සාරධර්  ම පද්ධතිය බිඳවැටී සමාජ විසංවිධානකාරී තත්ත්වයක් ඇති විමයි.එම තත්ත්වය මෙම ගම්මානය අධ්‍යයනයේදී පැහැදිලිව හඳුනා ගැනිමට හැකි විය .

මෙම දෘෂ්ටි කෝණයන් ඔස්සේ යමින් විවිධ ක්‍රමවේදයන් තුළින් අදාල කරුණු සොයා යන්නට උත්සුක විය. මෙහිදී ලිඛිත දත්තවලට අමතරව සොයා ගත් අනෙක් තොරතුරු සියල්ලම පාහේ අත්දැකීමෙන් උකහාගත් දේ යැයි පැවසීම නිරවද්‍ය යැයි සිතමි.ප්‍රශ්නාවලී වැනි දත්ත එක්රැස් කිරීමේ ක්‍රම වලට වඩා නිරීක්ෂණය සම්මුඛ සාකච්ජා වැනි ක්‍රම මෙහිදී වැඩිපුර යොදා ගැනිමට උත්සුක වූයේ

# <u>නිබන්ධ සාරාංශය.</u>

මෙම නිබන්ධය සඳහා වඩාත් කාලීන වූ මාතෘකාවක් තෝරා ගැනීමට මා වඩාත් උත්සුක විය. වර්තමානයේ ලාංකික සමාජයේ දක්නට ඇති විවිධ ගැටළු පිළිබඳ ව මුලින්ම අධ්‍යයනය කරනු ලැබුවේ ඒ නිසාවෙනි. මෙහිදී ලාංකික ජනවාර්ගික අර්බුදය ලාංකික සමාජ ගැටළු අතරින් වඩාත් ප්‍රධාන වන බව දුටිමි.මේ නිසා ජනවාර්ගික අර්බුදය සම්බන්ධ එක් පැතිකඩක් පිළිබඳව අධ්‍යයනය කිරීමට අදහස් කළෙමි. ඒ අනුව යුද්ධ අවදානමට ලක්වන ගම්මානයක වැසියන්ගේ ජීවන රටාව හා ඒ ආශ්‍රිත විවිධ ගැටළු කිහිපයක් පිළිබඳව සමාජ විද්‍යාත්මක දෘෂ්ටි කෝණයක සිට අධ්‍යයනය කිරීමට අදහස් කරමි. මෙහිදී මෙම අධ්‍යයනයට පාදක කරගනු ලැබුවේ උතුරු නැගෙනහිර පළාතේ ත්‍රස්තවාදී තර්ජනයට මුහුණ දෙන එක් මායිම් ගම්මානයකි. ත්‍රිකුණාමලේ දිස්ත්‍රික්කයේ කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වාන් ඇල නම් ගම්මානය තෝරාගනු ලැබුවේ මේ අයුරිනි.

පැරණි ගොවි ජනපදයක් වූ මෙම ගම්මානයෙහි සාම්ප්‍රදායික ජීවන රටාව ත්‍රස්තවාදයත් සමගම කිසියම් පෙරළියකට ලක් විය මෙම තත්ත්වය විවිධ සමාජ විද්‍යාත්මක දෘෂ්ටි කෝණ ඔස්සේ නිරීක්ෂණය කර නිගමන ලබා ගැනීමට වඩාත් උත්සුක වූයෙමි . ලංකාවේ පවතින මේ අර්බුදය සමහරු ත්‍රස්තවාදී අර්බුදයක් ලෙස හඳුන්වති .සමහරු එය ජනවාර්ගික ගැටළුවක් ලෙස පෙන්වා දෙති. තවත් සමහරු සුළු ජාතීන්ගේ අර්බුදයක් ලෙස පෙන්වා දෙති . මේ නිසා ප්‍රබල සමාජ විද්‍යාත්මක න්‍යායක් වන ඝට්ටනවාදී න්‍යාය හා කෘත්‍යවාදී න්‍යාය යන න්‍යායන් සමාජයට බලපානු ලබන ආකාරය මුල් කරගෙන මේ ප්‍රශ්නය දෙස බලන්නට උත්සුක විය .

මෙහිදී කාල්මාක්ස් විසින් ඉදිරිපත් කරන ලද අදහස් ඝට්ටනවාදයේදී වඩාත් වැදගත් වේ. එක් පසකින් මාක්ස්ගේ පන්ති විග්‍රහය සමාජ ස්ථරායන අධ්‍යයනයක් පමණක් නොවේ.එය සමාජ පෙරළි විග්‍රහ කිරීමේ ආකෘතියක්ද වේ. මෙහිදී මෙම පෙරළිය සඳහා මූලික වන්නේ බලය අහිමි හා බලය හිමි යන දෙකොට්ඨාශයයි. ඝට්ටනවාදී න්‍යායයේ තවත් ප්‍රබලයකු වන රැල්ෆ් ඩහරෙන්ඩොෆ් වැනියවුන් පෙන්වා දුන් පරිදි සෑම සමාජයකටම එක් පුද්ගල කණ්ඩායමක් තවත් පුද්ගල කණ්ඩායමකට එරෙහිව නැගී සිටී.එවැනි සමාජ විද්‍යාත්මක දෘෂ්ටියක් මෙම අර්බුදය තුළද දක්නට ඇත .

නිතරම මා මේ ගම්මානයේ ජීවත් වූ බැවිනි. විශේෂයෙන්ම සහභාගීත්ව නිරීක්ෂණය (participant observation ) ජීවන අත්දැකීම් ක්‍රමය (Living –in –Research ) වැනි දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවල ප්‍රධාන අංග කෙරෙහි වඩාත් සැලකිලිමත් විය. බොහෝ අවස්ථා වලදී මා මෙවැනි පොතක් ලිවීමට කරුණු එකතු කරන්නේ යයි ගම්මු නොදත්හ. විවේක අවස්ථාවල දී ගම්මානයේ නිවෙස් වලට යාමෙන් මිනිසුන් සමග සතුටු සාමීචියේ යෙදෙමින් මේ සඳහා බොහෝ කරුණු එක්රැස් කර ගැනීමට හැකි විය. මා පර්යේෂකයෙකු යැයි නොකියා ඔවුන් සමග කටයුතු කිරීමෙන් ඔවුන්ගේ ගැටළු නොබියව මා සමග කියන්නට ඔවුහු උත්සුක වූහ. මෙලෙසකටයුතු කිරීමට මා පෙළඹුවේ එවිට විශ්වසනීයත්වයකින් යුතුව තොරතුරු ලබාගත හැකි වේයයි විශ්වාස කළ හෙයිනි .

පුස්තකාලය
කැලණිය විශ්වවිද්‍යාලය (ශ්‍රී ලංකාව)
කැලණිය,

මෙම තත්ත්වය මත වර්තමානය වන විට ත්‍රස්තවාදය හේතු කොට ගෙන සමාජයේ උද්ගතව ඇති ගැටළු රාශියක් හඳුනා ගත හැකි විය. සමාජයම වශයෙන් ඉස්මතුව පෙනෙන්නේ මෙයින් ගැටළු කිහිපයක් වුවත් සමාජයම වශයෙන් ඉස්මතුව නොපෙනෙන ගැටළු රාශියක්ම මේ නිසා ඇති වී ඇති බව ද වඩාත් හොඳින් පෙනී ගියේය. සම්ප්‍රදායික සමාජයේ පැවති ප්‍රබල සාමූහික විඥානය බිඳ වැටීම නිසා සමාජ ඒකාබද්ධතාවය බිඳවැටී ගොස් ඇති අයුරු පෙනී යයි. මේ තත්ත්වය අනුව යුද අවදානයට හසුව ඇති ගම්මාන වල බාල මහළු සියල්ලන් තුළම යුද මානසිකත්වයක් වර්ධනය වී ඇත . සමස්තයක් ලෙස මෙම අර්බුදය නිසා ලාංකික ආර්ථික දේහය ප්‍රබල අර්බුදයකට පත්ව ඇත. එසේම යුද්ධයෙන් පීඩා විඳින්නේ යුද කලාපයේ මායිම් ගම්මානවල වැසියන්ම පමනක් නොවේ .සමස්ත ලාංකික වැසියන්ගේ ජීවන ක්‍රමය මේ නිසා අර්බුදයකට පත්ව ඇත එසේම දේශීය වශයෙන් පමණක් නොව ජාත්‍යන්තර වශයෙන් පවා මෙම අර්බුදය වර්ධනය වී ඇත.මේ නිසා යම් යම් ජාත්‍යන්තර සබඳතාවයන් පවා පළුදුව යා හැකි බව නිගමනය කළ හැක .

මෙකී අර්බුදය අවසන් කිරීමේ ප්‍රධාන විසඳුම නම් යුද්ධය අවසාන් කිරීමයි එහෙත් ආයුධ බලයෙන් පමණක් මෙය විසඳිය නොහැකි බව මෙම අධ්‍යනයේදී පැහැදිලිව පෙනී ගිය කරුණකි.මෙහිදී දෙපාර්ශ්වයම එක්වී ගනු ලබන ඒක පාර්ශ්විය පොදු දේශපාලන විසඳුමක් තුළින් මීට විසඳුම් සෙවිය යුතු යැයි අවසාන වශයෙන් නිගමනය කළ හැකිය.